*සැ.යු.*: මෙවර පළවන *ගැසට්* පත්‍රයේ VI කොටසේ 2026 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින් නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,480 - 2026 මාර්තු මස 13 සිකුරාදා - 2026.03.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 1062 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 1063 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 02 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මාර්තු මස 20 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1059 - B 82772 - (2026/03)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඩ් වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## සංශෝධනයයි

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියට නිලධාරින් සීමිත පදනම මත බඳවා ගැනීම - 2026 (2024 (II))

2026 ජනවාරි මස 30 දිනැති අංක 2474 *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත බඳවා ගැනීමේ නිවේදනයේ අයදුම්පත් කැඳවීමේ නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:-

- (*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.04.10** දින වේ. (කෙසේ වුවද ආයතනික කටයුතු හෝ තැපැල් ප්‍රමාද හේතුවෙන් **2026.04.24** දින දක්වා රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන අංශය වෙත ලැබෙන අයදුම්පත් භාර ගනු ලැබේ. නමුත් එදිනට පසුව ලැබෙන අයදුම්පත් හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

- (*ආ*) 2026.03.03 දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සහ කොන්දේසි සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

- ඉහත කරුණු හැර 2026 ජනවාරි මස 30 දිනැති අංක 2474 *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අනෙකුත් කරුණු තවදුරටත් නොවෙනස්ව පවතී.

02. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්.ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය.

2026 මාර්තු මස 09 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

03 - 202

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

### රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත්කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(2) සහ 54(3) ව්‍යවස්ථාවන් හි විධිවිධානවලට යටත් ව, 54(1) ව්‍යවස්ථාව යටතේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනකුගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමන්විත විය යුතු අතර, එම සාමාජිකයන් අතුරෙන් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන යටතේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයේ ඉදිරියේ දී ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීමට නිර්දේශ කරනු ලැබීම සඳහා මේ පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අයදුම්පත්‍ර කැඳවයි.

අයදුම්පත්‍ර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) ක්ෂණික සබැඳි යටතේ 'රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත්කිරීම' නමින් පළකර ඇති අයදුම්පත්‍රයට අනුකූලව පිළියෙල කළ යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026 මාර්තු මස 27 දින හෝ ඊට පෙර,**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ / විද්‍යුත් පණිවිඩයේ විෂයය වශයෙන් 'රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා සාමාජිකයකු පත්කිරීම' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

2026 මාර්තු මස 12 දින,
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

03 - 387

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

කම්කරු විනිශ්චය සහා ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහුකාර්ය බණ්ඩ I සේවා ගණයේ කම්කරු විනිශ්චය සහා භාෂණ පරිවර්තක තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත) - 2026

අධිකරණ සහ ජාතික ඒකබද්ධතා අමාත්‍යාංශය යටතේ කම්කරු විනිශ්චය සහා කාර්යාලවල පුරප්පාඩුව පවතින

භාෂණ පරිවර්තක සිංහල/ දෙමළ මාධ්‍යය තනතුරු - 06,

සිංහල/ඉංග්‍රීසි මාධ්‍යය තනතුරු - 03

සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "ලේකම්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, නො. 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "කම්කරු විනිශ්චය සහා ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහුකාර්ය බණ්ඩ I සේවා ගණයේ කම්කරු විනිශ්චය සහා භාෂණ පරිවර්තක තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත) - 2026" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.04.13** දින වේ.

*සටහන* **-** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

**01. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :**

(I.) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් වේ.)

(II.) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරියෙකු වසර 03ක පරිවාස කාලයකට යටත්වන අතර, එම කාලය ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(III.) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම වසර 05ක් තුළ දී ලබා ගත යුතු ය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් වසර 3ක් තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු අතර, අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව වසර 05ක් ඇතුළත ලබා ගත යුතු ය.

(IV.) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**02. බඳවා ගැනීමේ ශ්‍රේණිය : III ශ්‍රේණිය**

**03. වැටුප් පරිමාණය :**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN 02-2025 රු. 48,470-10x540 - 11x630 - 10x1,010 - 10x1,190- රු. 82,800 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් තලය රු. 48,470/- ක් වේ.

**04. සුදුසුකම් :**

I. අධ්‍යාපන සුදුසුකම් :

(අ.) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සා.පෙළ) විභාගයේ දී ගණිතය සහ භාෂණ පරිවර්තනයට අදාළ භාෂාවන් දෙක ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත් ව තිබීම;

*සහ*

(ඇ.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් ව තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත් ව තිබීම ප්‍රමාණවත් වේ.

**05. වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

**06. කායික සුදුසුකම්:**

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**07. වෙනත් සුදුසුකම් :**

(I.) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(II.) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(III.) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

**08. බඳවා ගැනීමේ ක්‍රමය -**

8.1 ලිඛිත විභාගය -

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් මගින් ලකුණු ලබා දේ.

ලිඛිත විභාගයේ දී ලකුණු ලබා දෙන ක්‍රමය :

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | සිංහල/ දෙමළ භාෂා පරිවර්තනය | පැය 01 | 100 | 40% |
| 02 | සිංහල/ ඉංග්‍රීසි භාෂා පරිවර්තනය | පැය 01 | 100 | 40% |

**විභාගය සඳහා විෂයය නිර්දේශය :**

| | *විෂයය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | සිංහල/ දෙමළ භාෂා පරිවර්තනය | සිංහල පාඨයක් හෝ පාඨයන් දෙමළ භාෂාවට හා දෙමළ පාඨයක් හෝ පාඨයන් සිංහල භාෂාවට පරිවර්තනය කිරීම |
| 02 | සිංහල/ ඉංග්‍රීසි භාෂා පරිවර්තනය | සිංහල පාඨයක් හෝ පාඨයන් ඉංග්‍රීසි භාෂාවට හා ඉංග්‍රීසි පාඨයක් හෝ පාඨයන් සිංහල භාෂාවට පරිවර්තනය කිරීම |

***සටහන*** - අයදුම්කරුවන් අදාළ පරිදි විෂයයන් දෙකෙන් එකකට පෙනී සිටිය යුතු ය. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගෙන්, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

**8.2 වෘත්තීය පරීක්ෂණය :**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබා දෙනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයේ දී වාචිකව භාෂාව පරිවර්තනය කිරීමේ හැකියාව මැන බලනු ලැබේ.

*වෘත්තීය පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ක්‍රමය :*

| | *විෂයය ක්ෂේත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | සිංහල/දෙමළ හෝ සිංහල/ ඉංග්‍රීසි භාෂා පරිවර්තනය | විනාඩි 30 | 100 | 40% |

**විභාගය සඳහා වන විෂයය නිර්දේශය**

| | *විෂයයන්* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | සිංහල/දෙමළ හෝ සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තනය | සිංහල, දෙමළ භාෂාවට හා දෙමළ, සිංහල භාෂාවට පරිවර්තනය කිරීම/ හෝ සිංහල, ඉංග්‍රීසි භාෂාවට හා ඉංග්‍රීසි, සිංහල භාෂාවට පරිවර්තනය කිරීම |

**8.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. (ලකුණු ලබා දෙනු නොලැබේ)

***සටහන*** - ලිඛිත විභාගය සහ වෘත්තීය පරීක්ෂණය යන දෙකෙන් ම ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**09.** ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළ යුතු අතර, 01-09 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 10-14 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, 15-17 ශීර්ෂ තෙවන පිටුවට සහ අනෙකුත් ශීර්ෂ සිව්වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු ය. ඊට අදාළ තොරතුරු නිවැරදිව හා පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම්පත මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම්පතට අනුව සැකසිය යුතු ය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අවසාන දින දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතු ය.

**සැලකිය යුතු ය :**

ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍රය ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා වල සේවයේ නියුක්ත නිලධාරින් විසින් තමන්ගේ

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර එවිය යුතු ය.

**10. විභාග ගාස්තු -**

සෑම අයදුම්කරුවෙකු ම විභාග ගාස්තු ලෙස රුපියල් 2,700.00 ක මුදලක් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට වන සේ ගිණුම් අංක 176-1001-9-9025184 ගිණුමට බැර කළ යුතු වේ. අදාළ කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ අමුණා එවිය යුතු ය.

11. අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවන් තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු / විශ්‍රාමික නිලධාරියෙකු, අදාළ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරවා ගත යුතු ය.

12. පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහුකාර්ය බණ්ඩ I සේවා ගණය සඳහා බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන,
ලේකම්,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.

2026 පෙබරවාරි මස 27 දින,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.
අංක 19,
ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

| |
|---|
| අංකය ........................................................ (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා) |
| මාධ්‍යය |

| | |
|---|---|
| සිංහල/දෙමළ | |
| සිංහල/ඉංග්‍රීසි | |

(අදාළ කොටුව සළකුණු කරන්න)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

**කම්කරු විනිශ්චය සභා ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහුකාර්ය බණ්ඩ I සේවා ගණයේ කම්කරු විනිශ්චය සභා භාෂණ පරිවර්තක තනතුර සඳහා අයදුම්පත්‍රය**

1.0 (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/ දෙමළෙන්) : ..............................................................................................
..........................................................................................................................................
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..............................................................................................
..........................................................................................................................................

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ..........................................................................................................
..............................................................................................................................................
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..........................................................................................................
..............................................................................................................................................

2.0 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ..........................................................................................................
..............................................................................................................................................

3.0 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ..........................................................................................................
..............................................................................................................................................

4.0 ලිපි ලැබිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(ස්ථිර ලිපිනය වෙනස් වේ නම් පමණක් සම්පූර්ණ කරන්න) ..........................................................................................

5.0 විද්‍යුත් තැපැල් ලිපිනය :

6.0 දුරකතන අංකය - (ජංගම) .................................... (ස්ථාවර) - ........................................
(සම්බන්ධ කර ගත හැකි ජංගම දුරකතන අංකයක් අනිවාර්යයෙන් සඳහන් කරන්න)

7.0 ජාතික හැඳුනුම්පත් අංකය : ............................................

8.0 ස්ත්‍රී/ පුරුෂ භාවය : .......................

9.0 උපන් දිනය : වර්ෂය ....................... මාසය ................ දිනය .................

10. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : වර්ෂ ....................... මාස .................. දින ...................

11. ජාතිය : ...................

12. විවාහක/අවිවාහක බව : .......................

13. අ.පො.ස. (උසස් පෙළ) විභාගය : ............................................

වර්ෂය : ............................................ විභාග අංකය : ............................................

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

14. අ.පො.ස.(සා/පෙළ) විභාගය :

| අනු. අංකය | විෂයය | පළමුවර | දෙවන වර | තෙවන වර |
|---|---|---|---|---|
| | | වර්ෂය : ................... විභාග අංකය : ............... | වර්ෂය : ................... විභාග අංකය : .......... | වර්ෂය : ................... විභාග අංකය : .......... |
| | | සාමාර්ථය | සාමාර්ථය | සාමාර්ථය |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

15. වෙනත් අධ්‍යාපන සුදුසුකම් : ..............................................................................................................................
..............................................................................................................................................................
..............................................................................................................................................................
..............................................................................................................................................................

16. භාෂා ප්‍රවීණතාව - (අදාළ තීරුවේ ✓ ලකුණ යොදන්න)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

17. විභාග ගාස්තු ගෙවූ කුවිතාන්සිය මෙහි අලවන්න.

| |
|---|
| |

**අයදුම්කරුගේ සහතිකය**

.............................................................................................................. වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව මත සේවයෙන්

විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

.................................. ........................................................,

දිනය අයදුම්කරුගේ අත්සන.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ....................................................................................... මහතා/ මහත්මිය/ මෙනවිය මා පුද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිටදී .............................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.
(*අනවශ්‍ය වචන කපා හරින්න)

දිනය ................................. ........................................................,

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

සහතික කරන ලද නිලධාරින්ගේ නම :.......................................
තනතුර :.......................................
ලිපිනය :.......................................

---

**අයදුම්කරු මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

**(රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ යෙදී සිටින අයදුම්කරුවන් සඳහා පමණි)**

.................................................................................. මහතා/ මහත්මිය/ මෙනවියගේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ ඇය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ, ස්ථිර/ තාවකාලික/ අභ්‍යාසලාභී/ අනියම්, නිලධාරියෙක්/ නිලධාරිනියක් වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.
(*අනවශ්‍ය වචන කපා හරින්න)

..........................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලබන නිලධාරියා.
(නිල මුද්‍රාව තබන්න)

දිනය : ....................................
නම : .......................................
තනතුර : .......................................
අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව : .......................................

03 - 107

## ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ලේඛනාරක්ෂක නිලධාරි III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ලේඛනාරක්ෂක නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම විභාගය මගින් බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ලේඛනාරක්ෂක නිලධාරි III ශ්‍රේණිය සඳහා වේ. අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026 අප්‍රේල් මස 10 වන දින වේ.**

02. සේවා කොන්දේසි :

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, 2018.07.12 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු ලේඛනාරක්ෂක නිලධාරි තනතුරට පත් කරනු ලැබේ.

(ආ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත බව දක්වා තිබුණ ද, අනාගතයේ දී බඳවා ගනු ලබන නිලධාරින් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ඇ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ලේඛනාරක්ෂක නිලධාරි III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඈ) තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

(ඉ) තනතුරට පැවරෙන කාර්යයන් :

| *අනුමත තනතුරු නාම* | *තනතුරු අනුමත ශ්‍රේණිය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| ලේඛනාරක්ෂක නිලධාරි | III, II, I | 45 | රාජ්‍ය හා පෞද්ගලික ලේඛන සමීක්ෂණයේ දී සහාය වීම, රාජ්‍ය හා පෞද්ගලික අංශවල ලේඛන ආබද්ධ කර ගැනීම සඳහා ලැයිස්තු හා උපලේඛන සැකසීම, ප්‍රාථමික ලැයිස්තු සැකසීම, අධිකරණ හමුවේ කරුණු දැක්වීම, මහජන සම්බන්ධතා රාජකාරි, ලේඛන සම්බන්ධ විමසීම් කටයුතු හා පර්යේෂණ කාමරය භාරව කටයුතු කිරීම, ප්‍රදර්ශන සඳහා සහාය වීම, ලේඛනවල භෞතික ආරක්ෂාව පිළිබඳ පරීක්ෂාව, පුස්තකාල රාජකාරි, අධිලේඛනවලට සුචිපත් සැකසීම හා වර්ගීකරණය කර තැන්පත් කිරීම, විද්‍යුත් මාධ්‍ය ලේඛන සඳහා සෙවීම් උපකෘත සැකසීම, අධිලේඛනවලට අංක ලබාදීම හා තැන්පත් කිරීම, ලේඛන අංකිතකරණ සම්බන්ධ කටයුතු ඉටුකිරීම, පර්යේෂණ කටයුතු සඳහා පැමිණෙන මහජනයාට සහාය වීම, අධිලේඛන ආශ්‍රයෙන් පර්යේෂණ ප්‍රකාශයට පත් කිරීම, ලේඛන ප්‍රකාශයට හා මුද්‍රණයට සහාය වීම, අධිලේඛන නිසි පරිදි තැන්පත් වී තිබේදැයි පරීක්ෂාව, කෝෂ්ඨාගාර අධීක්ෂණය කරන මාණ්ඩලික නිලධාරීන්ගේ පරිපාලන කටයුතුවලට සහායවීම, දෙපාර්තමේන්තුවේ මූල්‍ය හා භෞතික වැඩ සඳහා සහාය |

| *අනුමත තනතුරු නාම* | *තනතුරු අනුමත ශ්‍රේණිය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| ලේඛනාරක්ෂක නිලධාරි | III, II, I | 45 | වීම සහ එම කාර්යයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීමට සහාය වීම, වෘත්තීය ලිපිගොනු යාවත්කාලීන කර පවත්වාගෙන යාම, වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, ඉ - රාජ්‍ය සේවා කටයුතු ඉටු කිරීම, අධීක්ෂණ නිලධරයා සහ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවරනු ලබන තනතුරට අදාළ අනෙකුත් කාර්යයන් |

03. මාසික වැටුප් පරිමාණය:

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 චක්‍රලේඛය අනුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ ලේඛනාරක්ෂක නිලධාරි III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය

(MN 04 - 2025) රු. 53,060–10x800–11x1190–10x1320–5 x1350 - රු. 94,100/=

(ආරම්භක වැටුප් පියවර - රුපියල් 53,060.00) ක් වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මෙරට හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ශාස්ත්‍රවේදී, ලලිත කලාවේදී, දෘශ්‍ය කලාවේදී, අධ්‍යාපනවේදී, නීතිඥ හෝ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම;

*සහ*

අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි භාෂා විෂය සඳහා සම්මාන සාමර්ථයක් හෝ අ.පො.ස. (උ.පෙළ) ඉංග්‍රීසි/ සාමාන්‍ය ඉංග්‍රීසි විෂයක් ලෙස හදාරා සාමාන්‍ය සාමර්ථයක් ලබා තිබීම හෝ උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම.

(ආ) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

(ඇ) වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය;
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය;
III. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ඈ) වයස :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට (21)ට නොඅඩු විය යුතු අතර, අවුරුදු තිස් පහට (35)ට නොවැඩි විය යුතු ය.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) ලිඛිත විභාගය

පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර තුන (03)කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් විෂයය සමත්වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ:-

| අනු. අංකය | විෂයය | කාලය | මුළු ලකුණු | සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| 01. | බුද්ධි පරීක්ෂණය<br><br>අපේක්ෂකයා සතු තාර්කික ශක්තිය, භාෂාත්මක හැකියාව, සංසන්දනාත්මක හැකියාව, සංඛ්‍යාත්මක කුසලතාව හා බුද්ධිමය ශක්තිය මැන බැලෙන, සංඛ්‍යාත්මක හා රූපකාර සංදර්ශයකින් යුත් ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40 |
| 02. | අවබෝධය<br><br>අපේක්ෂකයා සතු අවබෝධාත්මක ශක්තිය, ගැටළු තේරුම් ගැනීමේ හැකියාව, විකල්ප අතරින් වඩාත් නිවැරදි විකල්ප තේරීම, පාඨයක මූලික අභිමතාර්ථ හා සංකල්ප තේරුම් ගැනීම පිළිබඳව බහුවිධ ස්වරූපකාර ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 $^{1}/_{2}$ | 100 | 40 |
| 03. | ඉංග්‍රීසි<br><br>අපේක්ෂකයා සතු භාෂා දැනුම, තේරුම් ගැනීමේ හැකියාව හා පරිවර්තනය කිරීමේ හැකියාව සොයා බලන ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 $^{1}/_{2}$ | 100 | 40 |

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුවන අතර සියලුම ප්‍රශ්න පත්‍රවලට එක් භාෂාවකින් පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

(i.) විභාග ප්‍රතිඵල .- අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තැපැල් මඟින් සිදු කෙරෙනු ඇත.

(*ආ*) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු |
|---|---|---|
| 01. | විෂය පිළිබඳ දැනුම<br><br>i. අධිලේඛන හා ලේඛන කළමනාකරණ මූලධර්ම පිළිබඳ දැනුම (ලකුණු 10)<br>ii. අදාළ ප්‍රතිපත්ති, ප්‍රමිති සහ ආචාර ධර්ම සංග්‍රහ පිළිබඳ දැනුම (ලකුණු 10)<br>iii. ශ්‍රී ලංකාවේ අධිලේඛන හා ලේඛන කළමනාකරණ නීති පිළිබඳ දැනුම (ලකුණු 10)<br>iv. ඩිජිටල් ලේඛන කළමනාකරණය පිළිබඳ දැනුම (ලකුණු 10)<br>v. ඩිජිටල් ලේඛන සංරක්ෂණය සහ ප්‍රවේශය පිළිබඳ දැනුම (ලකුණු 10) | 50 |
| 02. | අමතර අධ්‍යාපන සුදුසුකම්<br>i. අධිලේඛන හා ලේඛන කළමනාකරණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (ලකුණු 15)<br>ii. පශ්චාත් උපාධි පාඨමාලා (වෙනත් ඕනෑම විෂය ක්ෂේත්‍රයක) (ලකුණු 10)<br>iii. ඩිප්ලෝමා හෝ සහතික පත් පාඨමාලා<br><br>මසකට වැඩි ලකුණු 01 බැගින්<br>මාස තුනකට වැඩි ලකුණු 03 බැගින්<br>මාස හයකට වැඩි ලකුණු 05 බැගින් | 25 |

| *අනු අංකය* | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු* |
|---|---|---|
| 03. | අමතර වෘත්තීය සුදුසුකම්<br><br>i. අධිලේඛන හා ලේඛන කළමනාකරණය පිළිබඳව ලබා ඇති සේවා පළපුරුද්ද (ලකුණු 08)<br>අවුරුදු 2 හෝ ඊට වැඩි - ලකුණු 08<br>අවුරුදු 02 -01 දක්වා - ලකුණු 06<br>මාස 06 - අවුරුදු 01 දක්වා - ලකුණු 04<br>මාස 06ට අඩු - ලකුණු 02<br><br>ii. පිළිගත් ආයතනයකින් අධිලේඛන සහ ලේඛන කළමනාකරණය පිළිබඳව ලබා ඇති පුහුණු සඳහා (ලකුණු 06)<br>මාස 03 ට වැඩි - ලකුණු 06<br>මාස 03 – 01 දක්වා - ලකුණු 03<br>මාසයක් හෝ ඊට අඩු - ලකුණු 01<br><br>iii. පර්යේෂණ සහ ප්‍රකාශන කටයුතු<br>පර්යේෂණ ලිපි සඳහා එක් ලිපියකට ලකුණු 03 බැගින් (ලකුණු 06)<br>සඟරා ලිපි හෝ අධිලේඛන සහ ලේඛන කළමනාකරණයට අදාළ ප්‍රකාශන සඳහා එක් ප්‍රකාශනයකට ලකුණු 02 බැගින් | 20 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව<br><br>i. සන්නිවේදන කුසලතාව - ලකුණු<br>ii. 02කණ්ඩායම් වැඩ කිරීමේ හා නායකත්ව හැකියාව - ලකුණු 02<br>iii. සේවය පිළිබඳ උනන්දුව - ලකුණු 01 | 05 |
| | **එකතුව** | **100** |

(i.) ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ විෂය පිළිබඳ දැනුම, අමතර අධ්‍යාපන සුදුසුකම්, අමතර වෘත්තීය සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව මැන බැලීම සඳහා ඉහත සඳහන් පටිපාටිය අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

(ii.) ලිඛිත පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(ඇ) පත්වීම් ලබා දීම :

(i.) පුරප්පාඩු සංඛ්‍යාව 45 කි. මෙම පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% විවෘත ධාරාව යටතේ බඳවා ගනු ලබයි. සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත 30% ක ප්‍රතිශතය සඳහා මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මඟින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කරගනු ලැබේ.

(ii.) අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු පිරවීම පිළිබඳ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019(II) අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවන දිනය ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරනු ලැබේ.

(iii.) ලිඛිත පරීක්ෂණයේ දී හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ ලේඛනාරක්ෂක නිලධාරී III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර

තෝරා ගන්නා අපේක්ෂකයින් අතරින් එක් අයකු හෝ යම් කරුණක් හේතුවෙන් පත්වීම භාර නොගැනීම හෝ සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් පුරප්පාඩු ඇති වුවහොත්, කුසලතා අනුපිළිවෙළ අනුව අනෙකුත් අපේක්ෂකයින් තෝරා පත් කිරීම ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

06. විභාග ගාස්තු :

විභාග ගාස්තු රු.1200 කි. තවද එම විභාග ගාස්තුව "ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්" නමින් මහජන බැංකුව, තිඹිරිගස්යාය ශාඛාවේ පවතින බැංකු ගිණුම් අංක 086-1001-3902-6218 යට බැරකොට අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මඟින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.

07. අයදුම් කිරීමේ ක්‍රමය :

(අ) අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය 8 ½" x 12" (ඒ4) කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. පරිගණකයෙන් සකස් කරන ලද අයදුම්පත්‍ද භාවිතා කළ හැකිය. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමු පිටුවටද, ඉතිරිය සෙසු පිටුවලටද ඇතුලත්වන පරිදි අයදුම්පත සකස් කළ යුතු ය. අයදුම්පත එක් භාෂාවකින් පමණක් සම්පූර්ණ කළ යුතු ය.

(ආ) ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2026.04.10** දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි "ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්, අංක 7, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07." යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ ලේඛනාරක්ෂක නිලධාරී III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2026" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. **2026.04.10** දිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

(ඈ) අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසැල් ප්‍රධානියකු / විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී තැන, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැළකිය තත්ත්වයක් දරන කෙනෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු යි.

(ඉ) අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරු විසින්ම විඳදරා ගත යුතු ය.

(ඊ) අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවියේ (www.slida.lk) පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම්, දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග ශාඛාවේ දුරකතන අංක 011-5980264 හෝ 011-5980225 ඔස්සේ සතියේ

වැඩ කරන දිනයන්හි පෙ.ව. 08.30 සිට ප.ව. 4.00 දක්වා විමසිය හැකිය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. එසේ විමසීමේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එසේම විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ සියලුම විභාග අපේක්ෂකයන්ට ඒ බව දන්වා කෙටි පණිවිඩයක් (SMS) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් යොමු කරනු ඇත.

08. විභාගයට ඇතුළත් වීම :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

සටහන.- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

(ඇ) විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

09. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

10. වෙනත් කරුණු :

මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.

2026 මාර්තු මස 13 දින,
අංක 07,
පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07,
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයට (MN 4) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

**Open Competitive Examination for the Recruitment of Associated Officer Service Category (MN 4) in the Department of National Archives - 2026**

විභාගයට පෙනී සිටින මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA) ..........................................................................................

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................
(උදා: GUNAWARDHANA, H.M.S.K.) ..........................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ..........................................................................................
..........................................................................................

02. 2.1 ස්ථිර පදිංචි ලිපිනය : ..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................................

2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ..........................................................................................
..........................................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.) පුරුෂ - 0

05. උපන් දිනය :
(අ) වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

06. ජංගම දුරකතන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

07. විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය :..........................................................................................................................

08. අධ්‍යාපන සුදුසුකම් :

(අ) I. උපාධිය : ..........................................................................................
II. විශ්ව විද්‍යාලය/ ආයතනය : ..........................................................................................
III. ලියාපදිංචි අංකය : ..........................................................................................
IV. උපාධිය වලංගු දිනය : ..........................................................................................

(ආ) අ.පො.ස. (උ.පෙළ)

විභාගයේ වර්ෂය :

විභාග අංකය :

| *විෂයයන්* | *සාමාර්ථය* | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |

(ඇ) අ.පො.ස. (සා.පෙළ)

විභාගයේ වර්ෂය :

විභාග අංකය :

| *විෂයයන්* | *සාමාර්ථය* | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. අමතර අධ්‍යාපන සුදුසුකම් :

| *ආයතනය* | *පාඨමාලාවේ නම* | *කාල සීමාව* | *සහතිකය වලංගු දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

10. අමතර වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | පාඨමාලාවේ නම | කාල සීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

11. විභාග ගාස්තුව (ලදුපත අමුණා එවිය යුතුය.)

I. ගෙවන ලද බැංකුව : ........................................................................................
II. ගෙවූ මුදල : ........................................................................................
III. ගෙවූ දිනය : ........................................................................................
IV. ලදුපතේ අංකය : ........................................................................................

ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

12. අයදුම්කරුගේ ප්‍රකාශය/ සහතිකය:

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මා දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

..............................................................,
දිනය : ..................................................... අත්සන

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : **(අදාළ නොවන වචන කපා හරින්න.)**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................................................................................... නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ...................................... මස .................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන : ................................................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ................................................................................................
තනතුර : ................................................................................................
ලිපිනය : ................................................................................................
(නිල මුද්‍රාව)

දිනය : ......................................................................
**සටහන :** අයදුම්පත සහතික කළයුත්තේ ගැසට් නිවේදනයේ 07 ඡේදයේ (ඇ) වගන්තියේ සඳහන් පරිදිය.

14. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .............................................................................................................. නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියතු අයකු වන අතර, ඔහු/ ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය.

.................................................................... නිල මුද්‍රාව :

ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය : ..................................................

ආයතන ප්‍රධානියාගේ නම : .........................................................................
තනතුර : .........................................................................
සේවා ස්ථානයේ ලිපිනය : .........................................................................

03 - 108

---

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 II (2026)

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අනුමත සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2026 ජූනි මස කොළඹ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. මෙම නීතිරීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

(ii) අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති, *ගැසට්* නිවේදනයේ මුල වෙනම මුද්‍රණය කර ඇත.

02. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ https://www.doenets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications – Recruitment Exams/ E.B. Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 මාර්තු මස 16 දින පෙ.ව. 09.00ට** විවෘත වන අතර, **2026 අප්‍රේල් මස 10 දින ප.ව. 09.00ට අවසන් වේ.**

අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **විභාගයේ නම** සඳහන් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

03. <u>අනන්‍යතාව :</u>

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා වලංගු වනුයේ පහත ලේඛනයන් පමණි.

(*අ*) ජාතික හැඳුනුම්පත;
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(*ඇ*) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකිවන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොසිටි බව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණු දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

04. **අයදුම්පත :**

i. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදුකරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E- mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. පළමු වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවලදී නිලධරයන් විභාගයට පෙනී සිටින්නේ නම් එක් විෂයයක් සඳහා විභාග ගාස්තුව රු. 250.00 කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

- ❖ ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
- ❖ අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ් පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
- ❖ ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය / Flex යෙදවුම මගින් (Online Banking Method of Bank of Ceylon/ Flex App)
- ❖ ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of Bank of Ceylon)

*සටහන:-*

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

iii. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන් ම පිළිතුරු සැපයිය යුතු ය. අයදුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

iv. අයදුම්පත් භාරගන්නා අවසන් දින වනවිට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියට උසස්වීම් ලද නිලධරයන්ට පමණක් කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය හැක.

v. **ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන්ට දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉල්ලුම් කළ නොහැක.**

05. i) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ්

නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ළඟ තබාගැනීම ප්‍රයෝජනවත්වනු ඇත. ප්‍රවේශ පත්‍ර පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ii) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු ලවා සහතික කරවා ගත යුතු ය. විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර පමණක් ඉදිරිපත් කළ යුතු ය.

06. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමට අදාළ නියමිත කාලය තුළ තම අභිමතය පරිදි, එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී විභාගයට පෙනී සිටීමට නිලධරයන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමර්ථ්‍යයක් සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

07. **විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :**

පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ ප්‍රතිඵල අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත ද, මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජෙනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ. ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව අයත් වන සේවය සංශෝධනය කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

08. **විභාග පරිපාටිය**

II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02න් සමන්විත වේ.

විෂය අංකය (03) - ආයතන සංග්‍රහය
(කාලය පැය 02කි) (ලකුණු 100)

විෂය අංකය (04) - මුදල් රෙගුලාසි
(කාලය පැය 02කි) (ලකුණු 100)

**ආයතන සංග්‍රහය (විෂය අංකය - 03) - විෂය නිර්දේශය**

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

| | |
|---|---|
| XV පරිච්ඡේදය | අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යෑම |
| XVI පරිච්ඡේදය | නිවාඩු ගමන් |
| XXIII පරිච්ඡේදය | ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙළෙන රජයේ නිලධරයන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි |
| XXIV පරිච්ඡේදය | වැටුප් ණය හා අත්තිකාරම් |
| XXV පරිච්ඡේදය | වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහ |
| XXVII පරිච්ඡේදය | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග |
| XXVIII පරිච්ඡේදය | පරිපාලන කාර්ය පරිපාටි හා විධි |
| XXX පරිච්ඡේදය | රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල |
| XXXIII පරිච්ඡේදය | නීති උපදෙස් හා නීති ක්‍රියා මාර්ග |
| XLVII පරිච්ඡේදය | සාමාන්‍ය හැසිරීම හා විනය |
| XLVIII පරිච්ඡේදය | විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති |

**මුදල් රෙගුලාසි (විෂය අංකය - 04) - විෂය නිර්දේශය**

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

VI පරිච්ඡේදය

ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරිත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්, උප පත්‍රිකා පොත්, මුදල්, මුද්දර යනාදිය පිළිබඳ සමීක්ෂණ මණ්ඩල, අග්‍රිම, බැංකු ගිණුම්

(මු.රෙ.315 සිට 396 දක්වා)

XIII පරිච්ඡේදය

සැපයුම් , වැඩ හා සේවා

ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත්තු, සැපයුම්, භාණ්ඩවල භාරය සහ හරි වැරදි බැලීම, වැඩිමනත් භාණ්ඩ සහ පාවිච්චි කළ නොහැකි භාණ්ඩ.

(මු.රෙ.685 සිට 775 දක්වා)

09. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

10. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය.

2026 මාර්තු මස 05 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
**නිදහස් චතුරස්‍රය,**
කොළඹ 07.

03 - 133

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2019 II (2026)

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අනුමත සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2026 ජුනි මස කොළඹ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. මෙම නීතිරීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

(ii) අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති, *ගැසට්* නිවේදනයේ මුල වෙනම මුද්‍රණය කර ඇත.

02. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “Our Service” යටතේ ඇති “Online Applications – Recruitment Exams/ E.B. Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 මාර්තු මස 16 දින පෙ.ව. 09.00**ට විවෘතවන අතර **2026 අප්‍රේල් මස 10 දින ප.ව. 09.00**ට අවසන් වේ.

අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර “විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල” යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

03. **අනන්‍යතාව :**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා වලංගු වනුයේ පහත ලේඛනයන් පමණි.

(අ) ජාතික හැඳුනුම්පත,
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැලඳ නොමැති බව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ/ දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

04. **අයදුම්පත :**

(i.) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදුකරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii.) පළමු වරට මෙම විභාගයට අයදුම්කරන නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවලදී නිලධරයන් විභාගයට පෙනී සිටින්නේ නම් එක් විෂයක් සඳහා විභාග ගාස්තුව රු.250.00 කි. විභාග ගාස්තුව ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

- ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),
- අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ් පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions),
- ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය / Flex යෙදවුම මගින් (Online Banking Method of Bank of Ceylon / Flex App),
- ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of Bank of Ceylon).

*සටහන:-*

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

(iii.) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලු ම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන් ම පිළිතුරු සැපයිය යුතු ය. අයදුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(iv.) අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට බඳවා

ගත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධරයන්ට පමණක් පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටිය හැක.

05. (i) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍ර පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ii) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු ලවා සහතික කරවා ගත යුතු ය. විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර පමණක් ඉදිරිපත් කළ යුතු ය.

(iii) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(iv) විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු ය.

06. පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමට අදාළ නියමිත කාලය තුළ තම අභිමතය පරිදි, එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී විභාගයට පෙනී සිටීමට නිලධරයන්ට හැකිය. එසේකුදු වුවත් සාමාර්ථ්‍යය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

07. **<u>විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :</u>**

පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ ප්‍රතිඵල අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත ද, මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. **විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ. ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව අයත් වන සේවය සංශෝධනය කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

08. **විභාග පරිපාටිය :**

III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02න් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.

විෂය අංකය (01) - ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති (කාලය පැය 02කි) (ලකුණු 100)

විෂය අංකය (02) - මුදල් රෙගුලාසි (කාලය පැය 02කි) (ලකුණු 100)

**ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති**
**(විෂය අංකය - 01) - විෂය නිර්දේශය**

මෙම ප්‍රශ්න පත්‍රය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ-

| | |
|---|---|
| VIII පරිච්ඡේදය | අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා |
| XII පරිච්ඡේදය | නිවාඩු |
| XIII පරිච්ඡේදය | දුම්රිය බලපත්‍ර |

XIV වැනි පරිච්ඡේදය — දිවයින ඇතුළත රාජකාරි ගමන්

XIX වැනි පරිච්ඡේදය — රජයේ නිවාස

මුදල් රෙගුලාසි (විෂය අංකය - 02) - විෂය නිර්දේශය

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

I පරිච්ඡේදය.
වියදම් හා ආදායම් ඇස්තමේන්තු ඒකාබද්ධ අරමුදල සහ වියදම් සැලසුම් කිරීම හා වැඩ සටහන්ගත කිරීම, වාර්ෂික වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ස්වරූපය, නව යෝජනා, වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ වගකීම, වියදම් ඇස්තමේන්තුවල වෙනස් කිරීම් (මු.රෙ.1 සිට 68 දක්වා)

III පරිච්ඡේදය
මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව
ප්‍රධාන ගණක නිලධාරීන්, ගණක නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරීන් ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු.රෙ.124 සිට 147 දක්වා)

09. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේය.

10. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වන්නේය.

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය.

2026 මාර්තු මස 05 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
**නිදහස් චතුරශ්‍රය,**
කොළඹ 07.

03 - 134

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
## ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

### ප්‍රධාන රේගු පරීක්ෂකවරුන් සහ I ශ්‍රේණියේ රේගු පරීක්ෂකවරුන් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරට උසස් කිරීම සඳහා පැවැත්වෙන සීමිත තරග විභාගය - 2026

II ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරු පුරප්පාඩුවලින් 15% ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති,

(අ) ප්‍රධාන රේගු පරීක්ෂකවරුන්ගෙන්;

*හෝ*

(ආ) I ශ්‍රේණියේ රේගු පරීක්ෂකවරයකු වශයෙන් වසර 02ක සේවා කාලයක් සහිත I ශ්‍රේණියේ ස්ථිර පත්වීමක් ලබා ඇති රේගු පරීක්ෂකවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සුදුසුකම්

1.1 පළපුරුද්ද -

(i.) ප්‍රධාන රේගු පරීක්ෂකවරයකු වශයෙන් හෝ වසර 02ක සේවා කාලයක් සහිත I ශ්‍රේණියේ රේගු පරීක්ෂකවරයකු වශයෙන් ස්ථිර පත්වීමක් ලබා තිබීම.

(ii.) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 05 තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

1.2 වෙනත් -

(i.) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව නියමිත කාලසීමාව තුළ විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

(ii.) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත 01 හි දක්වා ඇති සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයවන **2026.04.06** දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

02. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – (Recruitment /E.B. Exams)" ඔස්සේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි.

**මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 මාර්තු මස 16 දින පෙ.ව. 09.00 ට විවෘතවන අතර 2026 අප්‍රේල් මස 06 දින ප.ව. 09.00 ට අවසන් වේ.**

නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය:-

i. ඕනෑම බැංකු ණය කාඩ් පතක් මඟින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මඟින් (Online Banking Method/ Flex APP of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon).

*සටහන:-*

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදු වන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

04. මෙම විභාගය ලිඛිත විභාගය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. ලිඛිත විභාගයේ එක් එක් විෂයයට පිරිනමනු ලබන ලකුණු ප්‍රමාණය සහ ලැබෙන කාලය පහත දැක්වේ:-

**1 වැනි කොටස - ලිඛිත විභාගය**

| | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| (01) | අභියෝග්‍යතා පරීක්ෂණය (පැය 01 යි) | 100 | 50 |
| (02) | ඉංග්‍රීසි භාෂාව (පැය 1 ½ යි ) | 100 | 50 |
| (03) | රේගු නීතිය හා ක්‍රියාපටිපාටිය (පැය 03 යි) | 100 | 50 |

**2. වැනි කොටස - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)**

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා ලිඛිත විභාගය සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනීමට හැකි වන පරිදි

ප්‍රමාණවත් අපේක්ෂකයන් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් සනාථ කර ගැනීමෙන් පසු බඳවා ගනු ලැබේ.

විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ. අයදුම්කරුවකු/ අයදුම්කාරියක විසින් මුළු විභාගයටම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යයේ වෙනසක් සිදු කිරීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන්/ අයදුම්කාරියන් තමන් එම සේවයට ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැක.

05. මෙම විභාගයේ විෂයයන්ට අදාළ විෂය නිර්දේශ පත්‍රය පහත දැක්වේ:-

**5.1 "අභියෝගාතා පරීක්ෂණය" ප්‍රශ්න පත්‍රයට අයත් විෂය නිර්දේශය**

භාෂා ප්‍රවීණත්වය, තර්කන ශක්තිය, සංඛ්‍යානමය හැකියාව, සාමාන්‍ය බුද්ධිය හා විශ්ලේෂණාත්මක හැකියාව මැනීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වේ.

**5.2 "ඉංග්‍රීසි" ප්‍රශ්න පත්‍රයට අයත් විෂය නිර්දේශය**

ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි.

**5.3 "රේගු නීතිය හා ක්‍රියා පටිපාටිය"** ප්‍රශ්න පත්‍රයට අයත් විෂය නිර්දේශය

i.
- නැව් බඩු/ ගුවන් බඩු ගොඩබෑම, ගබඩා කිරීම හා නිෂ්කාශනය කිරීම
- ආනයන ගුදමක් භාරව කටයුතු කරන සහකාර රේගු අධිකාරි II වන ශ්‍රේණියේ නිලධාරියකුගේ රාජකාරි කටයුතු
- නිල්පොත අවසන් කිරීම
- මත්පැන් ගුදම භාරව කටයුතු කරන සහකාර රේගු අධිකාරි II වන ශ්‍රේණියේ නිලධාරියාගේ රාජකාරි කටයුතු හා වගකීම්

ii. අපනයන -
- නෞකාගත කිරීම සඳහා ලැබෙන නැව් බඩු පිළිබඳ අනුගමනය කරන ක්‍රියාපටිපාටිය
- අපනයන විස්තර පරීක්ෂා කිරීම.
- තොග පොත සකස් කිරීම.

iii සංක්‍රමණික බඩු -
- නැව් බඩු තැන්පත් කිරීම හා නෞකාගත කිරීම
- සංක්‍රමණික නැව්බඩු ලේඛනය සකස් කිරීම
- වෙරළබඩ නෞකාගත කිරීම

iv බැඳි ගුදම්වලට අදාළ භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලිය

v සාමාන්‍ය - ආපසු ගෙවීම සහ එම ආපසු ගෙවීම් අනුමත කිරීම සඳහා වූ කොන්දේසි :-

- තීරු ගාස්තු ආපසු ලබා ගැනීම සඳහා බලපාන රෙගුලාසි, තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ වගුව - දිවයින තුළට හා දිවයිනෙන් පිටතට

- රේගු ආඥා පනත යටතේ භාණ්ඩ පිළිබඳ ප්‍රකාශයක් නොකිරීම, වැරදි ප්‍රකාශයක් කිරීම හෝ අඩුවෙන් මිළ ගණන් දැන්වීම පිළිබඳ කටයුතු කිරීම සඳහා දී ඇති බලතල

- සෝදිසි කිරීම හා අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් රේගු ආඥා පනතේ නියම කොට ඇති ක්‍රියා මාර්ග

- හොරෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට එරෙහිව කටයුතු කිරීම ගැන රේගු ආඥා පනතේ නියම කොට ඇති විධිවිධාන, නිලධාරීන්ගේ රාජකාරි කටයුතුවලට බලපාන සියලුම දෙපාර්තමේන්තු නියෝග.

06. 6.1 අභියෝගාතා පරීක්ෂණය, ඉංග්‍රීසි සහ රේගු නීතිය හා ක්‍රියා පටිපාටිය යන විෂයයන් තුනෙන් (03) එක් එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 50ක් ලබා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන්නේය.

ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් අදාළ බඳවා ගැනීම සඳහා අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලබන අතර, බඳවා ගැනීමට අනුමත

පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10% කට නොවැඩි ප්‍රමාණයක් කාන්තා නිලධාරිනියන් සඳහා වෙන් කෙරේ.

6.2 ඉහත 6.1 ඡේදයට අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරියන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්/ අයදුම්කාරියන් වෙත තැපැල් මඟින් හෝ www.results.exams.gov.lk නිල වෙබ් අඩවිය හරහා හෝ ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ.

6.3 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී/ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

6.4 අයදුම්කරුවකු/ අයදුම්කාරියක තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු/ අයදුම්කාරියක්ම විභාගයේ පළමු දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතු ය.

07. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ:-

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

08. 8.1 අයදුම්කරුවකුට/ අයදුම්කාරියකට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8.2 මෙම විභාගය 2026 ජුනි මාසයේ දී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය හා ස්ථානය පසුව දන්වනු ලැබේ.

09. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන්/ අයදුම්කාරියන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය *ගැසට්* නිවේදනය බලපැවැත් වේ. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

එස්.පී. අරුක්ගොඩ,
රේගු අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක 40, කෙළින් වීදිය,
කොළඹ 11.

03 - 182

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.